

# වාණිජ හා මූල්‍ය කේන්ද්‍රයක් ලෙස ශ්‍රී ලංකාවේ සංවර්ධනය

## අතීත මතක

පෙර අපර දෙදිග යා කැරෙන නාවුක මාර්ගයේ ඉතා වැදගත් ස්ථානයක පිහිටීම හේතු කොටගෙන අතීතයේ සිට ප්‍රමුඛ වාණිජ කේන්ද්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවට මනා පිළිගැනීමක් තිබිණි. මෙම තත්ත්වයේ වාසිය උපරිම වශයෙන් ලබාගැනීම පිණිස මෙරට අතීත රජවරුන් ක්‍රියා කළ අවස්ථාවන් ඉතිහාසයේ නොමඳව දක්නට ඇත. ඉපැරණි සේද මාවතෙහි පිහිටි වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස ද ශ්‍රී ලංකාවට වැදගත් තැනක් ලැබිණි. ශ්‍රී ලංකාවේ ස්වර්ණමය යුගය සේ සැලැකෙන මහා පරාක්‍රමබාහු සමයේ දී (1153 - 86) ලොව දස දෙසින් පැමිණි වෙළෙඳුන් ගේ ක්‍රියාකාරී වාණිජ කේන්ද්‍රයක් බවට මෙරට පත්ව තිබිණි. අනතුරුව අරාබි වෙළෙන්දෝ ඉන්දියාව, පර්සියාව, ඊජිප්තුව සහ යුරෝපය අතර භාණ්ඩ හුවමාරු මධ්‍යස්ථානයක් හැටියට ද ශ්‍රී ලංකාව යොදාගත්හ. ප්‍රථමයෙන් පෘතුගීසීන් ද ඉන් අනතුරුව ලන්දේසීන් හා බ්‍රිතාන්‍යයන් ද වශයෙන් යුරෝපීන් විසින් සිය වාණිජ කටයුතු සඳහා මෙරට යොදාගනු ලැබීමට මඟ පෑදුණේ ඒ අනුව ය. නිවැරදි ප්‍රතිපත්තීන් ඔස්සේ ගමන් කළහොත් නැවතත් ප්‍රවර්ත්‍යතා සහිත (viable) වූත් සුධාරණීය (sustainable) වූත් වාණිජ හා මූල්‍ය කේන්ද්‍රයක් බවට පත් වීමට තුඩු දෙන ඓතිහාසික පසුබිම, අපගේ උරුමයක් ද වන්නේ ය.

## වත්මන් උනන්දුව

වර්ධන ක්‍රමෝපායයක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ පස්වැදෑරුම් කේන්ද්‍රමය වැඩපිළිවෙළක් තුළින් ඉදිරියට යාමට සැලසුම් කර තිබෙන බව වර්තමාන රජය ප්‍රකාශ කරයි. නාවුක, ගුවන්, වාණිජ, බලශක්ති හා දැනුම් යන ක්ෂේත්‍රයන් ඔස්සේ එකී වැඩපිළිවෙළ ක්‍රියාත්මක වනු ඇත. ජනාධිපතිවරණයේ දී සිය ඉදිරි වැඩපිළිවෙළ ලෙස වත්මන් ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද 'මහින්ද චින්තන - අනාගත දැක්ම' යනු ඒ බව සැකෙවින් දැක්වෙන ප්‍රතිපත්ති ප්‍රකාශය වේ. වාණිජ කේන්ද්‍රයක් ගැන සඳහන් කරමින් මෙම ප්‍රකාශනයෙහි කරුණු දැක්වෙන්නේ මෙසේ ය. ''භෞතික යටිතලය වැඩිදියුණු කිරීමේ හා මානව සම්පත ඉහළ තලයකට ගෙන ඒමේ ප්‍රථම අභියෝගය මම ජයගතිමි. අපගේ කොටස් වෙළෙඳපොළෙහි සහ විදේශීය ආයෝජනයන් හි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබීම අපගේ ප්‍රයත්නයන් හි ප්‍රතිඵලයකි. මෙම ප්‍රවනතාව තවත් ඉහළ නැංවීම පිණිස අප පියවර ගත යුතු ය. මෙකී ප්‍රයත්නය ඔස්සේ ශ්‍රී ලංකාව වාණිජ, සේවා, ජාත්‍යන්තර බැංකු කටයුතු හා ජාත්‍යන්තර ආයෝජන යන ක්ෂේත්‍රයන් හි ආසියාවේ ඉහළ ම වානිජ කේන්ද්‍රයන්ගෙන් එකක් බවට පත් කරවීමට මම අපේක්ෂා කරමි.''

මූල්‍ය කේන්ද්‍රයක් විසින් සපයනු ලබන ඇතැම් සේවාවන් ක්‍රියාත්මක කළ හැකි වීමට නම් ඒ එක් එක් ක්ෂේත්‍රයන් අන්‍යෝන්‍යව ක්‍රියාකාරී විය යුතු හෙයින් ඒ සියල්ල ම එකවර ආරම්භ කිරීම අවශ්‍ය වන්නේ ය.

## කේන්ද්‍රයක් යනු කුමක් ද?

කේන්ද්‍රය වනාහි සරල විග්‍රහයක් ලෙස ගතහොත් බැහැර ස්ථානයන් හි සිටින සේවාර්ථීන් වෙත විවිධ වූ සේවාවන් සපයීමෙහි ලා ක්‍රියාත්මක වන්නා වූ ස්ථානයකි. කොළඹ නගරය විසින් දැනට ඉටු කැරෙමින් පවතින ආකාරයට බැහැර ප්‍රදේශවල ජීවත් වන රටවැසියනට එසේ සේවා සැපැයෙන ස්ථානයන් හැඳින්වෙන්නේ 'දේශීය කේන්ද්‍රයන් ' වශයෙන් ය. රජය විසින් යෝජනා කැරෙන ආකාරයේ ජාත්‍යන්තර කේන්ද්‍රයකින් බලාපොරොත්තු වන්නේ වෙනත් රටවල ජීවත් වන්නන් වෙත එබඳු සේවාවන් සැපැයීමයි. ස්වකීය ' පෝෂණ ප්‍රදේශය', දේශ සීමාවන් ඉක්මවා ප්‍රසාරණය කරමින් විශාල සේවාර්ථීන් ප්‍රමාණයක් සමඟ ගනුදෙනු කිරීමේ හැකියාව ජාත්‍යන්තර කේන්ද්‍රයක් නිර්මාණය වීම හේතු කොටගෙන රටකට ලැබේ. දැනට තමන් සතුව පවතින ප්‍රාග්ධන හා මානව සම්පත් උපරිම ඵල අත්වන සේ යොදාගනිමින් හා ප්‍රයෝජනයට නොගත් සම්පත්වල ඵල නෙලාගනිමින් වැඩි ආදායමක් උපයාගැනීම තුළින් අමතර වත්කම් ඇති කරගැනීමට රටකට එවිට හැකි වන්නේ ය. ජාත්‍යන්තර කේන්ද්‍රයක් බවට පත් වීම තුළින් රටකට අවශ්‍ය වෙනත් සංවර්ධන කාර්යයන් ද ශක්තිමත් වන අතර එමඟින් සුධාරණීය ආර්ථික සංවර්ධනයක් ඇති වන විට එරට ජනතාව වෙත සෞභාග්‍යය ද උදා වනු ඇති බව ඉතිහාසය දෙස අවධානය යොමු කරන විට පෙනේ.

## ආර්ථික කේන්ද්‍රයක පූර්ව අවශ්‍යතා

කිනම් ජාත්‍යන්තර අර්ථික කේන්ද්‍රයක් වුව ද සාර්ථක ලෙස ක්‍රියාත්මක වන්නේ පහත දැක්වෙන පූර්ව අවශ්‍යතා සම්පූර්ණ වී තුබුණහොත් ය.

1. ඉහළ ම මට්ටමේ භෞතික යටිතල පහසුකම්
2. නවීන සංඛ්‍යාංක යටිතල පහසුකම්
3. කුසලතා සහ නිපුණතා සහිත ශ්‍රමබලකායක්
4. ව්‍යාපාර හිතෛෂී නියාමන හා නීති ක්‍රමයක්
5. වාසිකර වූ මහ ආර්ථික ( රාජ්‍ය මුදල්, මුදල් හා විනිමය අනුපාත) ප්‍රතිපත්තීන්

ඉහත දැක්වුණු පූර්ව අවශ්‍යතා ශ්‍රී ලංකාව තුළ පවතින්නේ අවම තත්ත්වයක බව පෙනෙන්නට තිබේ.

## ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග

ප්‍රවර්ත්‍යතා සහිත වූත් සුධාරණීය වූත් වාණිජ හා මූල්‍ය කේන්ද්‍රයක් ශ්‍රී ලංකාව තුළ නිර්මාණය වීමට නම් අභියෝග දෙකක් ජය ගත යුතුව තිබේ. ඉන් පළමුවැන්න නම් සිංගප්පූරුව, හොංකොං, ඩුබායි සහ මුම්බායි වැනි දැනට පවත්නා සංවර්ධිත ආර්ථික කේන්ද්‍රයන් සමඟ තරගකාරීව ක්‍රියාත්මක වීමට සිදු වීමයි. තවත් වාණිජ කේන්ද්‍රයන් කීපයක් තරගයට අවතීර්ණ වෙමින් සිටීම ද එම අභියෝගය තවත් ප්‍රබල කරවන සාධකයකි. චීනයේ ෂැංහයි, දකුණු කොරියාවේ ඉන්චියොන්, දකුණු ඉන්දියාවේ කොෂිකොඩේ යනු එකී නව තරගකරුවන් වේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන්

(ICT) ව්‍යාපාර පරිවයනුත් තුළ පෙරට එමින් පවත්නා නව සොයාගැනීම්වල හිතකර තත්ත්වයන් වාණිජ හා මූල්‍ය කටයුතු කෙරෙහි බලපෑමක් ඇති කරමින් තිබීම දෙවැනි අභියෝගයයි. මෙකී වරධනයන් විෂයෙහි අවධානයෙන් සිටීමට මෙන් ම කඩිනමින් ඒවා ග්‍රහණය කරගැනීමට ද ශ්‍රී ලංකාව පියවර ගත යුතු ය.

## කළ යුතුව ඇති දෑ

වාණිජමය හා මූල්‍යමය වශයෙන් වැදගත් කේන්ද්‍රයක් බවට පත් වීමට නම් ඉහත අවශ්‍යතාවන් සියල්ලක් ම ඉහළ ම මට්ටමින් සපුරාගැනීම විෂයෙහි ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ අවධානය යොමු විය යුතු බව පෙන්වා දෙනු ලැබ තිබේ.

## භෞතික යටිතලය

නව වාණිජ හා මූල්‍ය කේන්ද්‍රයේ අවශ්‍යතාවනට සරිලන ආකාරයට පළමු ශ්‍රේණියේ වරායක්, ගුවන් තොටක්, මහා මාර්ග ඇතුළු අභ්‍යන්තර ප්‍රවාහන පහසුකම් ආදිය වැඩිදියුණු කරලීම සඳහා විශාල ලෙස මුදල් ආයෝජනය කිරීමට ශ්‍රීලංකාවට සිදු වනු ඇත.

## සංඛ්‍යාංක හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පහසුකම්

ලෝක ප්‍රවනතාවනට හා අවශ්‍යතාවනට ගැළපෙන මට්ටමට ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ද දැනුම් පදනම ද රැගෙන ඒම අවශ්‍ය ය. දකුණු කොරියාවෙහි තත්පරයකට මෙගාවොට් 31.7 ක් ද ජපානයේ මෙගාවොට් 17.4 ක් ද වශයෙන් දක්වෙන අන්තර්ජාල බාගත කිරීම් (internet downloading) වේගයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ පවතින මෙගාවොට් 1 .8 ක එම වේගය සැලැකෙන්නේ අවම වේගයක් වශයෙන් ය. ප්‍රධාන පරිගණක, උපස්ථ හා ආරක්ෂණ පහසුකම් ද ආපදාවන් යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රම ද ප්‍රමාණවත් පරිදි තිබීම අවශ්‍ය වන්නේ ය.

## මානව ප්‍රාග්ධන සංවර්ධනය

දැනුම් තලය ද කුශලතා හා නිපුණතා සමුදාය ද ශ්‍රම බලකායයන් තුළ පවත්නා ආකල්පයන් හි නම්‍යශීලී භාවය ද වාණිජ හා මූල්‍ය කේන්ද්‍රයක සාර්ථක භාවය පිණිස කවර රටක වුව ද පොදු අවශ්‍යතාවක් වේ. සේවාර්ථීන් සඳහා මනා සේවයක් සැපයිය හැකි වන්නේ ඉංග්‍රීසි බසින් (වර්තමානයේ ග්ලෝබිෂ් යන නම ව්‍යවහාර වේ.) සන්නිවේදනයෙහි යෙදීමේ හැකියාව සේවකයන් සතුව තුබුණහොත් ය. රාජ්‍ය සේවය හැකියාවන්ගෙන් මෙන් ම විෂයය දැනුමෙන් ද පරිපූර්ණ විය යුතු ය. කේන්ද්‍රයන් සඳහා ගුණාත්මක බවින් යුතු සේවකයන් ලබා දීමට නම් කුසලතාගරුක පිළිවෙතක් (meritocracy) ඇති කරගත යුතුව තිබේ.

## නීතියේ ස්වාධීනත්වය

අධිකරණ තීන්දු ලබා දීමේ දී ද අර්බුද විසඳීමේ දී ද මනෝමූල භාවයෙන් හා විධායකයේ ඇඟිලි ගැසීම්වලින් තොරව ක්‍රියාත්මක වීමේ අවකාශ නීති පද්ධතිය සතුව තිබිය යුතු ය. සාර්ථකව ක්‍රියාත්මක වීමේ හැකියාව කවර වෙළෙඳපොළකට වුව ද ලැබෙන්නේ එහි නිරතියන් ගේ දේපළ අයිතිය සුරක්ෂිත වුවහොත් ය. මෙය තහවුරු වන්නේ නිදහස් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයන් පිළිබඳ දැනුමකින් යුතුව සැකැසුණු ස්වාධීන නීති පද්ධතියක් තුළින් පමණි.

## නීතිය හා සාමය ද නීති ගරුකත්වය ද පිළිබඳ තත්ත්වය

ප්‍රභේදයකින් තොරව සැම කෙනෙකුට ම අදාළ වන්නා වූ නීති පද්ධතියකට අනුව නීතිය හා සාමය පවත්වාගෙන යාම වෙළෙඳපොළක සාර්ථකත්වය සඳහා වූ අවශ්‍යතාවකි.

## පහසුකම් සලසනසුලු නියාමන ක්‍රමයක්

රටෙහි නියාමන ක්‍රමය පෞද්ගලික අංශයට බාධා ඇති නො කරවන්නක් විය යුතුවාක් මෙන් ම එය පහසුකම් සලසන්නක් ද වීම අවශ්‍ය ය.

## විචක්ෂණශීලී රාජ්‍ය මුදල් ප්‍රතිපත්තිය (Fiscal Prudence)

ජනතාවට උපරිම ප්‍රයෝජන අත් වන ආකාරයෙන් රටෙහි පවත්නා සම්පත් යොදාගත හැකි වන සේ විචක්ෂණශීලී ව සැකැසුණු රාජ්‍ය මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට රජය වගබලාගත යුතු ය. ඒ අනුව ණය සහ දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය දැරිය හැකි මට්ටම දක්වා රැගෙන ඒමට හැකි වන සේ රාජ්‍ය ණය බර අඩු කරලමින් ප්‍රවර්තන රාජ්‍ය මුදල් හිඟය පහත හෙළීම අවශ්‍ය ය. උද්ධමනකාරී මූල්‍යකරණයෙන් මෙන් ම පෞද්ගලික අංශයේ ප්‍රයෝජනය සඳහා ඇති සම්පත් රාජ්‍ය පරිහරණයට යොදාගැනීමෙන් ද වැළකී සිටීම විචක්ෂණශීලී රාජ්‍ය මුදල් ප්‍රතිපත්තියක වැදගත් ම ලක්ෂණය වන්නේ ය.

## ස්වාධීන මුදල් කළමනාකරණය

මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය පවත්වාගෙන යා යුතු වන්නේ රජයේ මැදිහත් වීමකින් තොරව ය. ඒ සඳහා මහ බැංකුව ස්වාධීන ආයතනයක් බවට පත් විය යුතු බව පිළි ගනු ලැබ තිබේ. සිය ස්වාධීන මුදල් කළමනාකරණය තුළින් මුදලෙහි දේශීය මෙන් ම විදේශීය යන අගයන් දෙක ම මහ බැංකුව විසින් ආරක්ෂා කැරෙන බවට විශ්වාසයක් වෙළෙඳපොළ නිරතියන් තුළ ඇති වීම අවශ්‍ය ය.

## ඵලදායිතා වර්ධනය

රටෙහි ව්‍යාපාරයන් හි හා කර්මාන්තයන් හි තරගකාරිත්ව ශක්තිය රැකගත හැකි වන සේ සමස්ත ඵලදායිතා සාධකය විෂයෙහි රජය අවධානයෙන් සිටිය යුතු බවට නිර්දේශ වී තිබේ.

2004 සහ 2009 අතර කාලයේ සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතය වශයෙන් දැක්වුණු සියයට 6.1 න් සියයට 0.5 ක් ශ්‍රම බලකායෙහි වර්ධනය සඳහා වෙන් වුණු අතර ඵලදායිතා වර්ධනය වශයෙන් දැක්විය හැකි වන්නේ ඉතිරි සියයට 5 .6 ක ප්‍රමාණයයි. කෘෂි කර්මාන්තයෙහි නියැලෙන්නේ මුළු ශ්‍රම බලකායෙන්

තුනෙන් එක් පංගුවක් පමණක් වන අතර 2009 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතය වෙත ඔවුන්ගෙන් ලද දායකත්වය සියයට 12 .6 කට සීමා වූයේ ය. ඒ අනුව කෘෂි අංශයෙන් ලැබී ඇත්තේ පහළ ම ඵලදායිතාවකි. ඉහළ ම ඵලදායිතාව වාර්තා වූයේ මූල්‍ය අංශයෙන් ය. එබැවින් තරගකාරිත්වය ජය ගැනීමට නම් වත්කම් හි ( යටිතලමය, මූල්‍යමය, තාක්ෂණමය හා මානව ) හා සැකසුම් අංශයෙහි ( ගුණත්වය, වේගය, පරිභෝජකායනය (customization) සහ සේවා) තරගකාරිත්ව හැකියාව වර්ධනය කිරීමට පියවර ගැනීම අවශ්‍ය වන්නේ ය. ස්වකීය වෙළෙඳපොළ කොටස, ලාභ, වර්ධනය සහ පැවැත්ම ඉහළ නංවාගැනීම ඔස්සේ ලෝක තරගකාරිත්ව මට්ටම වෙත ළඟා වීමේ හැකියාව එමගින් රටට ලැබෙනු ඇත.

## යා යුතුව ඇති දුර

වාණිජ හා මූල්‍ය කේන්ද්‍රයක් රට තුළ නිර්මාණය කරගැනීමට නම් අඛණ්ඩ ක්‍රියාකාරිත්වයක් සහිත දිගුකාලීන සැලැස්මක් වෙත අවතීර්ණ වීමට ශ්‍රී ලංකාවට සිදු වන බව පෙන්වා දෙනු ලැබ තිබේ. ඒ සඳහා ලෝක වර්ධනයන් විෂයෙහි නිරන්තර අවධානයකින් පසු වන ප්‍රබල ක්‍රියාත්මක කරවීමේ ආයතනයක් පිහිටුවිය යුතුව ඇති බවට නිර්දේශ වී ඇත. එයට අමතරව මෙරට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ තලය ද කුසලතා හා නිපුණතා සමුදාය ද නියාමන ක්‍රමය ද වැඩි දියුණු කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය. මේ සියල්ලට ම වඩා අවශ්‍ය වන්නේ ව්‍යාපාර හිතෛෂී සංස්කෘතියක් රට තුළ නිර්මාණය කරවීමයි.

pathfinder

"පාත්ෆයින්ඩර්" පදනම
දුරකථන අංකය: 2 372 895
ඊමේල්: info@pathfinderfoundation.org
වෙබ් අඩවිය: www.sanvada.org, www.pathfinderfoundation.org

සංස්කරණ සහාය: අමීරා අරූස් මිය, ව්‍යාපෘති කළමනාකාරිණිය.

සංවාද SANVADA சம்வாதம்
'POLICY BRIEF 21'